# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

## தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு

## Ministry of Labour and Foreign Employment

හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MFE/DEV/HOB/03/vol ii | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022.09. 09 |

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : 02/2022 (I)

**එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා එතෙර රැකියා වල නියුතු ශ්‍රී ලාංකිකයන්හට බලපත්‍ර ලබා දීමට අදාලව **2022.08.31.** දින නිකුත් කරනු ලැබූ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක **02/2022** හි පහත සඳහන් වගන්ති මෙමඟින් සංශෝධනය කරනු ලැබේ.

**වගන්තිය 4 -කොන්දේසි**

**(1)** මෙහි **4.3 උප වගන්තිය** අවසානයෙහි පහත යෙදුමද ඇතුලත් කරනු ලැබේ.
"කෙසේ වෙතත්, ලියාපදිංචියෙන් වසර 2ක් ඉක්මවා යාමට පෙර වාහනය තෙවන පාර්ශවයකට පවරනුයේ නම් එහිදී පැවරීමේ බදු ලෙස වාහනයේ CIF වටිනාකමෙන් 10%ක් අදාල වන අතර එය ඇමෙරිකානු ඩොලර් වලින් ගෙවීමට කටයුතු කළ යුතුය".

**(2)** මෙහි **4.4 උප වගන්තියේ** ඇතුලත් ආනයනය කළ හැකි වාහනයේ උපරිම CIF වටිනාකම ඉවත් කරන අතර ඒ අනුව බලපත්‍ර ලබා දීමට අදාල සීමාවන් දැක්වෙන වගුවෙහි"හිමිකම ලැබීමට අදාල ප්‍රේෂණ කාලසීමාව සහ වාහනයේ CIF වටිනාකම " සඳහන් තීරය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

| ප්‍රේෂණ වල වටිනාකම (ඇ.ඩො.) | වාහන වර්ගය | හිමිකම ලැබීමට අදාල ප්‍රේෂණය කරන කාලසීමාව හා වාහනයේ CIF වටිනාකම |
|---|---|---|
| 3,000 හෝ ඊට වැඩි | රෝද දෙකක් සහිත, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන (Motor Bicycle-HS Code - 8711) | 2022 මැයි 01 දින සිට 2023 අප්‍රේල් 30 දින හෝ ඊට පළමුව වාහන බලපත්‍රය ඉල්ලුම් කරන දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය වටිනාකමෙන් 50%ට අඩු හෝ සමාන CIF වටිනාකමකින් යුත් වාහන |
| 20,000 හෝ ඊට වැඩි | රෝද හතරක් සහිත, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන [ Motor Car - HS Code - 8703 Commercial Vehicle - HS Code - 8704 (Double Cab,Van,Tipper)] | 2022 මැයි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින හෝ ඊට පළමුව වාහන බලපත්‍රය ඉල්ලුම් කරන දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණයෙන් 50%ට අඩු හෝ සමාන CIF වටිනාකමකින් යුත් වාහන |

**වගන්තිය 5- සම්පූර්ණ කළ යුතු නිර්ණායක**

**(3)** මෙහි **5.1 උප වගන්තිය** ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කරනු ලැබේ.

"විද්‍යුත් වාහනයේ බැටරි ඇසුරුම සහ විදුලි මෝටරය සඳහා අවම වශයෙන් වසර **3** ක් සඳහාවත් නිෂ්පාදකයින්ගේ/ආනයනකරුවන්ගේ/අපනයනකරුවන්ගේ වගකීමක් තිබිය යුතු අතර ජාත්‍යන්තර විදුලි වාහන (EV) මාර්ග ආරක්ෂණ ප්‍රමිතීන් ද සපුරාලිය යුතුය. අනුමත/සම්මත ක්‍රියාපටිපාටි/ක්‍රමවේදවලට අනුකූලව, භාවිතා කළ බැටරිය බැහැර කිරීමේ වගකීම භාර ගන්නා බවට ආනයන / අපනයනකරුවන් විසින් සහතිකයක් ලබා දිය යුතුය".

**(4)** මෙහි **5.3 උප වගන්තිය** ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය ආදේශ කරනු ලැබේ.

"පාවිච්චි නොකල විද්‍යුත් වාහනයක් **(Brand New)** හෝ ධාවන මනුව ශුන්‍ය **(New)** වියයුතු අතර විද්‍යුත් වාහනය නිෂ්පාදිත රටේ පළමු ලියාපදිංචි දිනයේ සිට වසරක් ඇතුලත ශ්‍රී ලංකාවට ආනයනය විය යුතුය".

**වගන්තිය 6. මෙහෙයුම් ක්‍රමවේදය**

(5) මෙහි **6.3 උප වගන්තිය** අවසානයට පහත සඳහන් යෙදුමද ඇතුලත් කෙරේ.

"මෙම යෝජනා ක්‍රමය යටතේ වාහන බලපත්‍රයක් නිකුත් කිරීමේ තීරක බලය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය සතු වේ".

**(6) වගන්ති 8** ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කරනු ලැබේ.

"චක්‍රලේඛයේ අඩංගු කරුණු සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක +94 112 582 447 ඔස්සේ විමසිය හැකිවේ".

ආර්.පී .ඒ. විමලවීර
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය